# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/55 - 2023 ජූලි මස 21 වැනි සිකුරාදා - 2023.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය සමග කියවිය යුතු, වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වන දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙන් වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවලට පවරා දී ඇති කාර්යය අනුව, මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සතු වී ඇති පාරවල් සහ පටු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බව 2023 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා තීරණ අංක 1155 යටතේ තීරණය කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී උපලේඛනයේ ඇතුළත් යම් පාරක් හෝ පටු මාවතක් කිසියම් ඉඩමක් හරහා හෝ යම් ඉඩමක කොටසකට ඇතුළත් වන බව, ඒ ඉඩමට හිමිකම් කියනු ලබන පාර්ශවයේ මතය වේ නම්, එකී ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා මේ නිවේදනයේ දින සිට මාස තුනක කාලයක් ඉකුත්වීමට පෙර නිසි අධිකරණයේ නඩුවක් පැවරීමට ක්‍රියාකල යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවදුරටත් එසේම, එකී මාස තුනක කාලය අවසන් වීමට පෙර එවැනි නඩුවක් පවරා නැති එකී උපලේඛනයේ ඇතුළත් සෑම පාරක්ම සහ පටු මාවතක්ම නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති පාරක් හෝ පටු මාවතක් ලෙස සලකනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. චන්දන කුමාර,
ලේකම්,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2023 ජූලි මස 20 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.


1A - PG 6397— 07 (2023/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## තීරණය

''වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වන දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ''වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග'' මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ, 2022.06.06 දින අංක 2283/02 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් හා පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් හා පටු මාවත් නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මම 2023.07.18 දිනැති තීරණ අංක 1155 අනුව, තීරණ කරමි.

| අනු. අංකය | මාර්ග අංකය | මාර්ගයේ නම | අධිකාරිය | ස්වභාවය | ආරම්භක බණ්ඩාංක වම | ආරම්භක බණ්ඩාංක දකුණ | අවසන් බණ්ඩාංක වම | අවසන් බණ්ඩාංක දකුණ | මාර්ගයේ මුළු දුර (M) | මාර්ගයේ සාමාන්‍ය පළල (වැටෙන් වැටට) (M) | මාර්ගයේ සංවර්-ධිත පළල (M) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2946 | NWP NTP B640/139/A/1 | මාරවිල දුවවත්ත සංචාරක මධ්‍යස්ථානය ඉදිරිපිට පාර | PS | TAR | 246609.243,94157.114 | 246607.693,94157.883 | 246642.537,94258.09 | 246640.988,94258.528 | 110.7 | 2.7 | 2.4 |
| 2972 | NWP NTP C 80/31/7/A/1 | පුරුදුවැල්ල ඔය මාර්ගයේ පටුමග | PS | TAR | 251533.595,99597.418 | 251533.454,99592.946 | 251469.842,99601.106 | 251469.651,99596.483 | 64.09 | 3 | 2.1 |
| 2973 | NWP NTP A3/156/A/1 | කටුනේරිය පුස්තකාල පාර | PS | GRV | 240512.952,96127.818 | 240510.853,96128.618 | 240518.069,96163.514 | 240516.271,96163.912 | 64.46 | 3.6 | 3 |
| 2974 | NWP NTP A3/162/A/8 | පහල කටුනේරිය වෙරළ අවට දෙවන අතුරු මාර්ගය | PS | TAR | 240078.963,95486.73 | 240079.454,95490.25 | 240103.638,95482.359 | 240104.034,95483.768 | 42.66 | 3 | 2.4 |
| 2975 | NWP NTP C 57/1/A/1 | කොස්වත්ත මොරකැලේ මාර්ගයේ දකුණු පස පළමු අතුරු මාර්ගය | PS | TAR | 240672.781,102500.644 | 240669.126,102502.938 | 240707.958,102566.09 | 240704.287,102568.432 | 71.93 | 3.2 | 3 |

EOG 07 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.